# ගොවිපලේ ආදායම වැඩි කරන සූකරයින්

මිනිසා තමාගේ ප්‍රයෝජනය සඳහා සතුන් හීලෑ කර ගැනීමටත්, ඇති කිරීමටත් පෙළඹුන ඈත අතීතයේ පටන්ම ඌරා මිනිස් පාලනයට හසු වූ සත්වයෙක් විය. ඉතිහාසය ක්‍රිස්තු පූර්ව 2900 පමණ වනතෙක් දිවෙන බවට තොරතුරු ලැබී ඇති ඌරු පාලනය නැගෙනහිර ආසියාවේ ආරම්භ වූයේ යැයි විශ්වාශ කෙරේ. ආදිතම ඊජිප්තු, ග්‍රීක හා රෝම වැසියන් විසින් මස් ලබා ගැනීමේ අරමුණින් ඌරන් ඇතිකල බවට තොරතුරු ඇත. මේ හැරුන විට


පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරි

**බණ්ඩාර රත්නායක**

විසිනි


බුද්ධ කාලයේ දී පවා ඉන්දියාවේ ඌරු පාලනය කෙරුන බවට යම් යම් තොරතුරු බෞද්ධ සාහිත්‍ය යෙන් සොයාගත හැකිය. චුන්ද සූකරයා පිළිබඳ කථා පුවතිනුත් බුදුන් වහන්සේ ගේ අවසාන සමයේ සූකර මාංශ වැළඳ රෝගාතුර වූ බව පවසන තොරතුරු මගිනුත් ඒ බව පැහැදිලි වේ.

ක්‍රි.ව. 1493 දී කොළොම්බස් විසින් ඌරු පාලනය නව ලෝකයට හඳුන්වා දෙන ලදී. ඔහුගේ චාරිකාවෙන් පසු බටහිරින් හයිටි දූපතේ සිට කියුබාවටත්, කියුබාවෙන් ප්ලොරිඩාවටත් ඌරු පාලනය පැතිරී ගියේය. මේ හැරුන විට මෙම කාලයේදී ම පෙර දිග චීනය තායිලන්තය වැනි රටවලත් ඌරන් ඇතිකිරීම ආරම්භ විය.

ශ්‍රී ලංකාවේ සත්ව පාලනය ව්‍යාපාරයක් වශයෙන් ආරම්භ වූයේ සහ ව්‍යාප්ත වූයේ විදේශීය ආධිපත්‍යයට ගොදුරු වී සිටි කාලයේදී ය. ඌරු පාලනය ද මෙරටට හඳුන්වා දෙන ලද්දේ එම කාලයේදීය. නමුත් දෙවන ලෝක යුද්ධයෙන් පසුව මෙය වඩාත් ප්‍රචලිත විය. ඌරු කර්මාන්තය ආරම්භයත් සමගම දිවයිනේ විවිධ ප්‍රදේශවල සත්ව ගොවිපලවල් ආරම්භ වූ නමුත් කර්මාන්තයක් ලෙස ජනතාව අතර ව්‍යාප්ත වූයේ සහ රඳා සිටියේ බටහිර මුහුදු වෙරළබඩ තීරයේයි. දිවයිනේ අනිකුත් ප්‍රදේශවල මෙම කර්මාන්තය ව්‍යාප්ත වීමට ප්‍රධාන බාධකයක් වූයේ සංස්කෘතික හා ආගමික ඇදහීම් වලින් පිටුවහලක් නොලැබීමය.

1983 දී ශ්‍රී ලංකාවේ සිටි ඌරන් ප්‍රමාණය 77,000 කි. ඔවුන් මෙරට ප්‍රධාන කෘෂි දේශගුණික කළාප අනුව ව්‍යාප්තව සිටි අයුරු පහත සඳහන් සටහනින් හඳුනා ගත හැකිය.

**ප්‍රධාන දේශගුණික කළාප වලට අනුව ශ්‍රී ලංකාවේ ඌරන්ගේ ව්‍යාප්තිය—(1983) ප්‍රමාණය දහස් වලිනි**

| වර්ගය | වියලි කළාපය | අතුරුමැදි කළාපය | තෙත් කළාපය | මුළු ප්‍රමාණය |
|---|---|---|---|---|
| ඌරා | 16 ... | 16 ... | 45 ... | 77 |

මූලය ; ශ්‍රී ලංකාවේ සතුන් පිළිබඳ සංඛ්‍යා ලේඛණ (1984/85)

මෙම සංඛ්‍යා ලේඛණ වලට අනුව මුළු ඌරන් ගෙන් 58%ක් ඇති කරන ලද්දේ තෙත් කළාපයේයි. මෙම ප්‍රදේශයේද වැඩි වශයෙන් ඌරු පාලනය සිදු වන්නේ බටහිර වෙරළබඩ තීරයේයි. මෙහි වැඩි වශයෙන් ජීවත්වන්නේ කතෝලික ආගමිකයන් වීම මෙම කාර්‍ය්‍ය ව්‍යාප්ත වීමට යම් පිටුවහලක් වී ඇත. නමුත් හින්දු සහ බෞද්ධ වැනි ආගම් මගින් සත්ව පාලනය සම්පූර්ණයෙන්ම තහනම් කොට ඇත. මුස්ලිම් ආගමිකයන් ඌරා පිළිකුල් සහගත සතෙකු ලෙස සලකමින් උගෙන් ඈත්වෙයි. මෙම හේතුන් නිසා දිවයිනේ ඌරු පාලනයෙන් විශාල කොටසක් එක්තරා බිම් තීරයකට පමණක් සීමා වූවක් විය.

පසුගිය දශක කිහිපය තුල දී මෙරට "ඌරු පාලනය" වර්ධන උපනතියක් නොපෙන්විය. පෙනෙන්නට ඇත්තේ එහි පහල වැටීමකි. දැනට සොයාගත හැකි සංඛ්‍යා ලේඛණ අනුව 1970 දී මෙරට සිටි ඌරන් සංඛ්‍යාව 108,000, 1983 වන විට 77,000 දක්වා පහල වැටුනි. මෙය ඌරු පාලනයේ 29%ක පහල වැටීමකි. ඌරු කර්මාන්තය ආශ්‍රයෙන් කෙරෙන ඌරු මස් නිශ්පාදනය 1980 දී ටොන්



1,141ක්ව තිබී 1983 වන විට ටොන් 622 දක්වා පහල වැටුනි. එය ඌරු මස් නිශ්පාදනයේ 46% පහල වැටීමකි.

ශ්‍රී ලංකාවේ මෙවැනි තත්ත්වයක් පැවැතුනත් ගිණිකොන දිග ආසියානු රටවල මෙම කර්මාන්තය ඉතාමත් දියුණු තත්ත්යක පවතී. ඌරු කර්මාන්තය ඉතාමත් දියුණු තත්ත්වයක පවතින රටවල් අතරින් පිලිපීනය හා තායිලන්තය ප්‍රධාන ස්ථානයක් ගනී. පිලිපීනයේ ජනතාව අතර එය කොතරම් ජනප්‍රිය දෙයක් ද යන්න සෑම කුටුම්භයකටම සූකරයෙක් (A pig for every home) යන වදනින්ම පැහැදිලිය. ඌරු පාලනය එරට සෑම නිවසකම පාහේ දැකිය හැකි කර්මාන්තයකි.

මෙරට ඌරු පාලනය මෙන්ම ඌරු මස් සකස් කිරීමේ අංශයද එතරම් දියුණු තත්ත්වයක නොපවතී. කොළඹ නගරය අවට කුඩා පරිමාණයේ මස් සකස් කිරීමේ ව්‍යාපෘති කිහිපයක් ඇතත් එය රටේ අවශ්‍යතාවයන් සපුරාලීමට කිසිසේත් ප්‍රමාණවත් නොවේ. මෙය මගින් සපුරාලන්නේ අධික ආදයම් ලබන්නන් ගේත්, සංචාරක හෝටල් වලත්, වෙනත් ඉහල පෙළේ ආපන ශාලාවලත් ඇති ඉල්ලුම පමණි. අනික් අතට ග්‍රාමීය ප්‍රදේශවල ඇතිකරනු ලබන සතුන් සම්පූර්ණයෙන්ම ගෘහස්ථ අවශ්‍යතා පමණක් සපුරාලන අතර වෙළඳ පොල අතිරික්තයක් නොපෙන්වයි. මේ හැරුණ විට ගම්බද ප්‍රදේශවල ජනතාව වනයේ ජීවත් වන ඌරු වර්ගයක් වන ''වල් ඌරන්'' ද තම ප්‍රයෝජනය සඳහා දඩයම් කර ගනී.

ශ්‍රී ලංකාවේ ඌරු පාලනය කෙබඳු තත්ත්වයක පවතින්නේ ද යන්න මෙරට ඒකපුද්ගල ඌරු මස් පරිභෝජනය පෙන්වනු ලබන පහත සඳහන් සංඛ්‍යා වලින් පැහැදිලි කරගත හැකිය.

**ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ඌරුමස් පරිභෝජනය**
**(කිලෝ ග්‍රෑම් වලින්)**

| | 1978/1979 | 1981/1982 |
|---|---|---|
| ශ්‍රී ලංකා | 0.13 | 0.16 |
| නාගරික අංශය | 0.11 | 0.09 |
| ග්‍රාමීය අංශය | 0.15 | 0.19 |
| වතු අංශය | 0.03 | 0.06 |

මූලය : පාරිභෝගික මූල්‍ය සමීක්ෂණය, ශ්‍රී ලංකා මහ බැංකුව

දැනට ලංකාවේ ඇති කරනු ලබන දේශීය වර්ගයේ ඌරෙකුගේ බර කිලෝ 50ක් පමණ වන අතර, දේශීය විදේශීය දෙමුහුන් සතෙකුගේ බර කිලෝ 75ක් පමණ වේ. මේ හැරුනවිට විදේශීය වර්ගයක හොඳට වැඩුන සතෙකුගේ බර කිලෝ 100 ද ඉක්මවා යයි. එසේ වුවත් මෙරට ව්‍යාපාරික වශයෙන් මේ කාර්යයෙහි නියැලීම එතරම් දුරට සිදු නොවන නිසා ඇතිකිරීමට සතුන් තෝරා ගැනීමේ දී විශේෂ සැලකිල්ලක් නොදක්වේ. රජයේ සත්ව ගොවිපලවල බර වැඩි හොඳ වර්ගයේ සතුන් ඇති කරනු ලබන අතර අනෙකුත් ගොවීන් සියල්ලම වාගේ බොහෝ විට දේශීය වර්ගයේ සතුන් ඇති කරනු ලබයි.

යම් යම් හේතුන් නිසා ඌරු පාලනය මෙරට එතරම් දියුණු තත්ත්වයක නොපැවතුනත් අනිකුත් සත්ව පාලනයන්ට වඩා ඌරු පාලනයෙන් වැඩි ආදායමක් ඉපයිය හැකිය. ඒ එයටම විශේෂිත වූ හේතු කිහිපයක් නිසාය.

තමා ගන්නා ආහාර වලින් අධික පෝෂණ ගුණයක් උරා ගැනීමේ ශක්තිය ඌරාට ඇත. විශේෂයෙන්ම යම් ආහාරයකින් වැඩි වශයෙන්ම මේදය උපයා ගැනීමේ හැකියාව ඇත්තේ ඌරාට බව විද්‍යාඥයින් පෙන්වා දී ඇත.

අනිකුත් වර්ගවල සතුන් පාලනයට මෙන් මෙහිදී ආහාර සඳහා අධික වියදමක් දැරීමට සිදු නොවේ. විශේෂයෙන්, පරණ වූ මිනිස් ආහාර, ධාන්‍ය, අල වර්ග, බෝග සුන්බුන් ආදිය ඌරන්ට තම ආහාර වශයෙන් උපයෝගී කොටගත හැකිය.

වර්ධනය සඳහා වැදගත්ම සාධකයක් වන බෝවීමේ ශක්තිය ඌරන්ගේ ඉතාමත්ම වැඩිය. වසරකට දෙවරක් පැටවුන් ලබා දීමේ ශක්තිය ඊරියකට ඇති අතර වරකට පැටවුන් 6–8ත් අතර ප්‍රමාණයක් ලබා දෙනු ලබයි.

ඌරෙකු වැඩීමට ගත වන්නේ ද කෙටි කාලයකි. මාස 8–12 ත් අතර කාලයක් ඌරාගේ වැඩීම සඳහා ප්‍රමාණවත්ය. මෙම නිසා අවසන් නිශ්පාදනය ලබා ගැනීමට එතරම් කාලයක් බලා සිටීමට සිදු නොවේ.

පොල්වත්තක හෝ මුඩු බිමක ඌරු ගොවිපලක් පවත්වා ගෙන යා හැකිය. එසේම මෙය ආරම්භ කිරීම සඳහා විශාල මූල ධනයක් අවශ්‍ය නොවේ. සුළු මුදලක් යොදවා ලබා ගන්නා ඌරු පැටවුන් දෙදෙනෙකුගෙන් ටික කාලයක දී විශාල ඌරු ගොවිපලක් සාදගත හැකිය.

අලෙවි කිරීමේ හැකියාව සහ මිළ මට්ටම පිළිබඳ ගැටළුවක් ද මෙරට ඌරු කර්මාන්තයට නොමැත. දැනට ශ්‍රී ලංකාවේ ඌරු මස් සඳහා හොඳ ඉල්ලුමක් තිබේ. එසේම ඉහල මිළක් තීරණය වී ඇත. ඉල්ලුමට ප්‍රමාණවත් තරම් සැපයුමක් තවමත් සිදු නොවනු ඇත.

මෙම කර්මාන්තයෙන් ලබා ගත හැකි තවත් වාසියකි. එනම් ඌරන් දසදෙනෙකුගෙන් වසරකදී වගා අක්කරයකට අවශ්‍ය තරම් පොහොර ප්‍රමාණයක් ලබාගැනීමට හැකි වීමයි.

කෙසේ වෙතත් ඌරු පාලනය මගින් මෙරට ගොවියාට වැඩි ආදායමක් ලබා දිය හැකිය. ඒ හැරුණු විට ඌරු මස් වල අඩංගු පෝෂ්‍ය පදර්ථ අනික් බොහෝ මස් වර්ග අභිබවා ඉදිරියට විත් ඇත. ලෝක ජනතාව මස් පරිභෝජනයෙන් ලබා ගන්නා ප්‍රෝටීන් ප්‍රමාණය අනුව දෙවෙනි තැන ලබා ගන්නේ ඌරුමස් ය. ඒ හැරුණුවිට කැලරි ප්‍රමාණය අතින් පළමු තැන ලබා ගැනීමට ඌරුමස් සමත් වී ඇත. මේ හැරුණු විට මේදය අතින් ද ඌරුමස් ප්‍රමුඛ ස්ථානයක් ගෙන සිටී.

**උරුමස් ග්‍රෑම් 100ක අඩංගු වී ඇති ප්‍රධාන පෝෂ්‍ය පදර්ථ වර්ග කිහිපයක්**

| වර්ගය | ප්‍රෝටීන් ග්‍රෑම් | | ශක්තිය කිලෝකැලරි | | මේදය ග්‍රෑම් |
|---|---|---|---|---|---|
| ඌරු මස් | 10 | ... | 535 | ... | 55 |

මූලය : වෛද්‍ය පර්යේෂණ ආයතනය.

මෙතරම් සාපේක්ෂ වාසි තිබුනත් රටේ මුළු ජන ගහනයෙන් 8%ක් පමණ වන මුස්ලිම් ජනතාව මෙම කර්මාන්තයෙන් හා මස් පරිභෝජනයෙන් සම්පූර්ණයෙන්ම වැලකී සිටී. 80%ක් පමණ වන ග්‍රාමීය ජනතාව ආගම් මගින් හික්මවනු ලැබූ සිතුම් පැතුම් මගින් මෙයින් ඈත්වෙයි. ඌරු කර්මාන්තය දිනෙන් දින පහල යන තත්ත්වයකට දූන් පත් වෙමින් පවතී.

මෙම තත්ත්වය තේරුම් ගත් මහජන බැංකුවේ නිලධාරීන් පිරිසක් (කඳාන ශාඛාවේ) ඌරන් ඇති කිරීමේ ව්‍යාපෘතීන් සඳහා ණය ලබා දීමේ ක්‍රමයක් සකස් කර ඇත. මේ වැඩ සටහනට අනුව තෝරාගත් අයදුම් කරුවන් කිහිප දෙනෙකුට කෘෂි සංවර්ධන අධිකාරිය මගින් මසක් වයසැති ඌරු පැටවුන් දෙදෙනා බැගින් ලබා දෙයි.

| බැංකු ණය ක්‍රමය | | ක්‍රියාකාරී වියදම් රු. |
|---|---|---|
| දිනකට කිලෝ 2 බැගින් පැටව් 2කට මස කට පුන්නක්කු කිලෝ 120 ට | ... | 240 00 |
| අමතර වියදම් ... | ... | 150 00 |
| එකතුව | ... | 390 00 |
| මුල් මාස 6 තුල ආදයම (1500×2) | ... | 3000 00 |
| වියදම (390×5) | ... | 1950 00 |
| දළ ලාභය (මාස 6 කින්) | ... | 1050 00 |
| එම නිසා පළමු වසර තුළ ලාභය | ... | 2100 00 |

මෙම කරුණු අනුව රුපියල් 2000 ක ණය මුදලක් ලබා දීමට බැංකුව කටයුතු කොට ඇත. මෙය මෙරට ඌරු පාලනයේ අනාගත සුභ නිමිත්තක් වීමට ද බැරි නැත. කෙසේ වෙතත් මොනයම් බාද අවහිරතා ඇති වුවත් රටේ ජාතික නිෂ්පාදනයට විශාල කොටසකින් දයක විය හැකි ඌරු පාලනය ඉදිරියට ගෙන යැම මෙරට කෘෂිකාර්මික වර්ධනය වඩාත් වේගවත් කිරීමක් වනු ඇත.

* * * * *